AL/2020/43/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ධර්මය I<br>கிறிஸ்தவம் I<br>Christianity I | 43 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- ⁕ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ⁕ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ⁕ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිලිමත් කියවා, පිළිපදින්න.
- ⁕ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ජුදා හා ක්‍රිස්තියානි පිළිගැනීමට අනුව පුරාණ ගිවිසුමේ ඇති කෘති ගණන කොපමණ ද?
(1) 36 (2) 37 (3) 39
(4) 46 (5) 48

**2.** පුරාණ ගිවිසුමේ සඳහන් චරිත අතුරෙන් වීර නායකයකු වන්නේ,
(1) ගිඩියොන් ය. (2) ආරොන් ය. (3) ජුදා ය.
(4) ලෙවී ය. (5) ආමොස් ය.

**3.** ඉශ්රායෙල් උතුරු රාජ්‍යයේ සමරිතානු ජන කොටස බිහිවූයේ,
(1) ඉශ්‍රායෙලුන් පිරිසක් අසිරියාවේ පදිංචි වීම නිසා ය.
(2) ඉශ්‍රායෙලුන් පිරිසක් බබිලෝනියාවේ පදිංචි වීම නිසා ය.
(3) අසිරියාවට විප්‍රවාස වූ උතුරේ වැසියන් ආපසු තම දේශයට නොපැමිණීම නිසා ය.
(4) ඉශ්‍රායෙල් ඉතිරිවූවන් හා මිත්‍යා දෘෂ්ටික අසිරියානු පදිංචිකරුවන් අතර ඇතිවූ අන්තර් විවාහ නිසා ය.
(5) බබිලෝනියාවේ පදිංචිකරුවන් හා ඉශ්‍රායෙල් ඉතිරිවූවන් අතර ඇතිවූ අන්තර් විවාහ නිසා ය.

**4.** ශුද්ධ බයිබලයට අයත් පොත් කිහිපයක් යුගල වශයෙන් පහත දක්වා ඇත. ඒවා අතුරෙන් පංච පුස්තකයට අයත් පොත් යුගලය කුමක් ද?
(1) ජෝෂුවා හා විනිශ්චයකාරයෝ... (2) රූත්ගේ කථාව හා එස්රා
(3) නික්මයාම හා ගණන් කථාව (4) නෙහෙමියා හා එස්තර්
(5) ඔබදියා හා ජෝනා

**5.** මැවීම පිළිබඳ පළමු කථාව අඩංගු මුල් පිටපත තුළ සූර්යයා හා චන්ද්‍රයා නම් කර තිබුණේ නැත. ඊට හේතුවූයේ,
(1) සූර්යයා හා චන්ද්‍රයා මවන ලද්දේ මෙම දින හත අවසානයේ නිසා ය.
(2) සූර්යයා හා චන්ද්‍රයා සඳහා නම් එම කාලයේ දී භාවිත නොවූ නිසා ය.
(3) මැවීමේ සංසිද්ධිය ආරම්භ කිරීමට පෙර සූර්යයා හා චන්ද්‍රයා පැවති නිසා ය.
(4) මෙම කතා පුවත රචනාවී ඇත්තේ බහු දේවවාදී පරිසරයක බහු දේවවාදයට විරුද්ධව නිසා ය.
(5) සූර්යයා හා චන්ද්‍රයා වෙනුවට ලොකු ආලෝකය හා කුඩා ආලෝකය යන නම් භාවිතය පහසු වූ නිසා ය.

**6.** මනුෂ්‍යයා දේව ස්වරූපය අනුව මවනු ලැබීමෙන් ඔහු යම් ආකාරයක මැවීමේ ක්‍රියාවලියට පංගුකාර වෙමින් ලෝකය පාලනය කිරීමට කැඳවනු ලබයි. මෙහි 'පාලනය කිරීම' (හෙබ්‍රෙව් 'රාදා') යන ක්‍රියාපදයෙන් ගම්‍ය කරනුයේ,
(1) රැක බලා ගැනීමයි.
(2) යටත් කර ගැනීමයි.
(3) බලයට නතු කර ගැනීමයි.
(4) ආදි මව්පියන්ට ලැබුණු ආධිපත්‍යයයි.
(5) අවශ්‍යතා සඳහා සතුන් මැරීමට අවසරයයි.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

7. ප්‍රාග් ඉතිහාසයේ මිනිසා දෙවියන් වහන්සේ අතහැරයාමේ උච්ච ස්ථානයට පත් වූ පසුව නැවත මිනිසා එම ගමන ආපසු හැරවීමේ ක්‍රියාදාමය ආරම්භ වන්නේ,
(1) නෝවා ගෙනි. (2) ඒසව් ගෙනි. (3) ඊසාක් ගෙනි. (4) ජාකොබ් ගෙනි. (5) ආබ්‍රහම් ගෙනි.

8. දෙවියන් වහන්සේ විසින් ඊසාක් හා ජාකොබ් වැනි නායකයින් තෝරා ගැනීමට ප්‍රධානතම හේතුව වූයේ,
(1) ඔවුන් නිර්හීත අය වීම ය.
(2) තමන් වහන්සේගේ ප්‍රේමය ය.
(3) ඔවුන් ලබා සිටි ජීවිත අත්දැකීම් ය.
(4) එම නායකයින්ගේ ශුද්ධවන්තකම ය.
(5) ඔවුන් ආබ්‍රහම්ගේ පරපුරෙන් පැවතීම ය.

9. මෝසෙස් හා ආරොන් පාරාවෝ මුණ ගැසීමට අලුයම ගංගාවට එන අතරතුර දී පාරාවෝ මුණගැසී ඉශ්‍රායෙල් ජනයාට පාළුකරයේ දී දෙවියන් වහන්සේට වන්දනා කිරීමට ඉඩ සලසා දෙන ලෙස ඉල්ලූහ. නමුත් අවසර නොලැබීම නිසා ඇති කළ වසංගත වනුයේ,
(1) 1, 4 සහ 7 වේ. (2) 2, 5 සහ 8 වේ. (3) 3, 6 සහ 9 වේ.
(4) 4, 6 සහ 10 වේ. (5) 5, 6 සහ 8 වේ.

10. පාස්කු බැටළුවා මරණු ලැබුවේ කුමන වේලාවේ දී ද?
(1) පෙ.ව. 6.00 සහ ප.ව. 3.00 අතර (2) පෙ.ව. 6.00 සහ ප.ව. 4.00 අතර
(3) පෙ.ව. 6.00 සහ ප.ව. 6.00 අතර (4) පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර
(5) පෙ.ව. 9.00 සහ ප.ව. 4.00 අතර

11. පාළුකර ගමනේ දී දෙවියන් වහන්සේ පෙන්වූ ගස ජලයට දමා කරදිය ජලය මිහිරි ජලය බවට හරවා ගත් ස්ථානය,
(1) මස්සා වේ. (2) මෙරිබා වේ. (3) මාරා වේ. (4) ට්‍රිම්ෂා වේ. (5) සිරිබෝනිස් වේ.

12. පළමුවන මෙසියානික දිවැස් වැකිය ප්‍රකාශ කළ දිවැසිවරයා කවුරුන් ද?
(1) නාතාන් (2) යෙසායා (3) එලියා (4) ජෝවෙල් (5) ආමොස්

13. පහත සඳහන් දිවැසිවරුන් අතුරෙන් එක් අයෙකුගේ නාමයේ අර්ථය 'සමිඳාණන් වහන්සේ ගලවන සේක' යන්නයි. එම දිවැසිවරයා කවුරුන් ද?
(1) එලියා (2) ජෙරමියා (3) නාතාන් (4) ආමොස් (5) යෙසායා

14. තෙහිළි ගීතිකා සඳහා අනු අංක යෙදීමේ දී පුරාණ ගිවිසුමේ හෙබ්‍රෙව් පිටපත හා ග්‍රීක පිටපත අතර එක් තෙහිළි ගීතිකාවක වෙනසක් ඇත. ඊට හේතුව හෙබ්‍රෙව් පිටපතෙහි එක් ගීතයක් ග්‍රීක පිටපතෙහි ගීත දෙකක් ලෙස සඳහන් වීමය. එම ගීත දෙක මොනවා ද?
(1) අංක 7 සහ 8 (2) අංක 8 සහ 9
(3) අංක 9 සහ 10 (4) අංක 10 සහ 11
(5) අංක 11 සහ 12

15. දේව මාළිගා බද්ද ශෙකෙල් කාසිවලින් ගෙවීමට නියම වූයේ,
(1) ඒවායේ කල් පැවැත්ම වැඩි නිසා ය.
(2) ශෙකෙල් කාසි මගින් ගනුදෙනු කිරීම පහසු නිසා ය.
(3) ශෙකෙල් කාසි වටිනාකමින් වැඩි නිසා ය.
(4) රෝම කාසියේ සීසර්ගේ මුහුණ තිබීම නිසා ය.
(5) වෙනත් මුදල් ඒකකවලට මාරු කිරීම පහසු නිසා ය.

16. දැනට පිළිගෙන ඇති බහුතර මතය අනුව ශුද්ධ වූ ලූක්තුමාගේ ශුභාරංචිය ලියැවී ඇත්තේ,
(1) ක්‍රි.ව. 60 - 70 අතර ය. (2) ක්‍රි.ව. 65 - 75 අතර ය.
(3) ක්‍රි.ව. 70 - 80 අතර ය. (4) ක්‍රි.ව. 75 - 85 අතර ය.
(5) ක්‍රි.ව. 80 - 90 අතර ය.

17. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ කොපමණ කාල පරාසයක තොරතුරු ඇතුළත් ද?
(1) අවුරුදු 20ක (2) අවුරුදු 25ක (3) අවුරුදු 30ක
(4) අවුරුදු 35ක (5) අවුරුදු 40ක

Department of Examinations - Sri Lanka

18. නව ගිවිසුමේ ගැලවීමේ ඉතිහාසය එළි දක්වන ග්‍රන්ථය වනුයේ,
(1) කොරින්තිවරුන්ට ලියන ලද සංදේශය ය. (2) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත ය.
(3) එළිදරව් පොත ය. (4) රෝමවරුන්ට ලියන ලද සංදේශය ය.
(5) මාක් ශුභාරංචිය ය.

19. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දර්ශනය වූ පසු ශුද්ධ වූ පාවුලුතුමා නැවත පෙනීම ලැබුවේ කවුරුන් අත් තැබූවිට ද?
(1) අකිලා (2) පේද්‍රුතුමා (3) කොර්නේලිස් (4) බාර්ණබස් (5) අනනියස්

20. සිරියාවේ අන්තියෝකියේ පැවති ජුදෙව් හා ජුදෙව් නොවන සාමාජිකයන්ගෙන් යුත් මිශ්‍ර සභාවේ සේවය කිරීමට ශුද්ධ වූ පාවුලුතුමාට අවස්ථාව ලැබුණේ කවුරුන් මැදිහත් වූ නිසා ද?
(1) අනනියස් (2) බාර්ණබස්
(3) ජොහන් මාක් (4) තියාතිරාවේ ලිදියා
(5) අකිලා සහ ප්‍රිස්කිලා

21. ශුද්ධ වූ පාවුලුතුමාගේ ප්‍රථම ධර්මදූත චාරිකාවේ අරමුණ වූයේ,
(1) නව සභාවන්ගේ වර්ධනය විමසීම හා අවශ්‍ය මග පෙන්වීම ලබාදීම ය.
(2) නව සභා සාමාජිකයින් දැනුවත් කිරීම හා දිරිමත් කිරීම ය.
(3) ඇදහිලිවතුන් කිතුනු ඇදහිල්ලේ සවිමත් කිරීම හා දිරිමත් කිරීම ය.
(4) ජෙරුසලම් මන්ත්‍රණ සභා තීරණ වෙනත් සභාවන් වෙත දැන්වීම ය.
(5) අන්තියෝකියේ සභාවේ දී ශුද්ධාත්මයාණන්ගෙන් ලද මග පෙන්වීම සාක්ෂාත් කර ගැනීම ය.

22. ශුද්ධ වූ පාවුලුතුමාට ගල් ගසා ඔහු මරණයට පත්වූයේ යැයි සිතා ඔහුව නුවරින් පිටතට ඇද දැමුවේ,
(1) දර්බයේ දී ය. (2) ඉකෝනියේ දී ය.
(3) පම්පිලියේ පර්ගායේ දී ය. (4) ලුස්ත්‍රාවේ දී ය.
(5) පිසිදියේ අන්තියෝකියේ දී ය.

23. ශුද්ධ වූ පාවුලුතුමාට අකිලා හා ප්‍රිස්කිලා හමුවූයේ,
(1) කොරින්තියේ දී ය. (2) පර්ගාහි දී ය.
(3) පිනීසියේ දී ය. (4) ගලාතියේ දී ය.
(5) දර්බයේ දී ය.

24. ක්‍රිස්තුන් වහන්සේ තම අපෝස්තුළුවරුන් ලෙස තෝරාගත් දොළොස් දෙනා අතුරෙන් පොදු ජන සමාජයට අයත් **නොවූ** දෙදෙනා වූයේ,
(1) ජාකොබ් හා ජොහන් ය. (2) මතෙව් හා බර්තලමෙව් ය.
(3) සීමොන් හා ඇන්ඩෘ ය. (4) පිලිප් හා තෝමස් ය.
(5) සීමොන් හා ජූඩ් තද්දෙවුස් ය.

25. පුනර්ජීවනය පිළිබඳව ශුභාරංචිවල සඳහන් ප්‍රථම සාධකය කුමක් ද?
(1) එම්මාවුස් ගමනේ දී දර්ශනය වීම
(2) ශුද්ධ වූ තෝමස්තුමාට දර්ශනය වීම
(3) ශ්‍රාවකයින්ට ප්‍රකාශ වීම
(4) මසුන් ඇල්ලීමේ ප්‍රාතිහාර්යය
(5) හිස් වූ සොහොන

26. "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය; ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි" . මාක් ශුභාරංචියේ සඳහන් මෙම ප්‍රකාශය පුරාණ ගිවිසුමෙහි ග්‍රන්ථ දෙකක දක්නට ඇති වගන්ති දෙකක එකතුවකි. එම ග්‍රන්ථ වනුයේ,
(1) හිතෝපදේශය හා ජෙරමියා ය.
(2) ගීතාවලිය හා ජෙරමියා ය.
(3) ගීතාවලිය හා එසකියෙල් ය.
(4) යෙසායා හා ජෙරමියා ය.
(5) ගීතාවලිය හා යෙසායා ය.

27. ක්‍රිස්තුන් වහන්සේ විසින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීමේ සිද්ධිය සමදර්ශක ශුභාරංචි තුනට අමතරව වාර්තා කර ඇත්තේ,
(1) පිලිප්පි ලිපියේ ය. (2) රෝම ලිපියේ ය.
(3) 1 කොරින්ති ලිපියේ ය. (4) එපීස ලිපියේ ය.
(5) 2 කොරින්ති ලිපියේ ය.

Department of Examinations - Sri Lanka

**28.** කොරින්ති සංඝය තුළ දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පෙර සම්ප්‍රදායක් ලෙස පවත්වන ලද්දේ,

(1) දිළින්දන්ට දෙන භෝජන සංග්‍රහයකි. (2) ශාරීරිකව සූදානම් වීමේ පිළිවෙතකි.
(3) තුතිදීමේ භෝජන සංග්‍රහයකි. (4) නිරාහාර රැකීමේ පිළිවෙතකි.
(5) එකමුතුකමේ/ප්‍රේමයේ භෝජන සංග්‍රහයකි.

**29.** මුල් කිතුනු සභාවේ පත් කරන ලද තේවාචාරිවරුන් සමාජ සේවා කටයුතුවල නිරත වුව ද ස්තේපන්තුමා හා පිලිප්තුමා ඊට අමතරව යොමු වූ කාර්ය දෙකක් වූයේ,

(1) සහනාධාර සැපයීම හා රෝගීන්ට උපස්ථාන කිරීම ය.
(2) ශුභ අස්න දේශනා කිරීම හා බව්තීස්ම-ස්නාපනය කිරීමට යොමු වීම ය.
(3) සහනාධාර සැපයීම හා ශුභ අස්න දේශනා කිරීම ය.
(4) ධර්මය ඉගැන්වීම හා වත් පිළිවෙත් පැවැත්වීම ය.
(5) අසරණයන්ට සරණය වීම හා සාමය සුරැකීමට යොමු කිරීම ය.

**30.** මාකස් අවුරේලියස් අධිරාජ්‍ය සමයේ දී ප්‍රාණ පරිත්‍යාගී වූයේ,

(1) ශුද්ධ වූ ජස්ටින්තුමා, ශුද්ධ වූ ඇග්නස්තුමිය හා ශුද්ධ වූ ෆීලික්ස් පාප්තුමා ය.
(2) ශුද්ධ වූ පොලිකාප්තුමා, ශුද්ධ වූ ලුසියාතුමිය හා ශුද්ධ වූ සෙබස්තියන්තුමා ය.
(3) ශුද්ධ වූ ෆේබියන්තුමා, ශුද්ධ වූ අගතාතුමිය හා ශුද්ධ වූ ඇලෙක්සැන්ඩර්තුමා ය.
(4) ශුද්ධ වූ අයිරේනියස්තුමා, ශුද්ධ වූ පර්පෙචුවාතුමිය හා ශුද්ධ වූ ලෝරන්ස්තුමා ය.
(5) ශුද්ධ වූ ජස්ටින්තුමා, ශුද්ධ වූ සිසිලියාතුමිය හා ශුද්ධ වූ පොලිකාප්තුමා ය.

**31.** ඩෙසියස් අධිරාජ්‍ය සමයේ දී රෝම දෙවිදේවතාවන්ගේ සහ අධිරාජ්‍යයාගේ පිළිමවලට පුද පූජා ඔප්පු කිරීමට හා ඒ පිළිමවලින් නිරූපණය වන්නන් දේවත්වයෙන් පිදීමට කැමැත්ත පළ කරමින් අධිරාජ්‍යයේ සියලු වැසියන් අනිවාර්යයෙන් ලබා ගත යුතු වූ සහතිකය කුමක් ද?

(1) සබත් දින සහතිකය
(2) ලිබෙලුස් සහතිකය
(3) මිලාන් ආඥා සහතිකය
(4) සැන්හෙන්ඩ්‍රින් සභා සහතිකය
(5) සෙනෙට් මණ්ඩලයෙන් නිකුත් කරන සහතිකය

**32.** ක්‍රි.ව. 313 දී මිලාන් ආඥාව නිකුත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) ගැලේරියස් (2) ලිසිනියස්
(3) කොන්ස්ටන්ටයින් (4) මැක්සිමිනස්
(5) මැක්සන්ටියුස්

**33.** ලතින් සභා පියවරුන්ගේ ගණයට අයත් වන්නේ කවුරුන් ද?

(1) ශුද්ධ වූ මහා බැසිල්තුමා (2) ශුද්ධ වූ අගොස්තීනුතුමා
(3) ශුද්ධ වූ අතනාසියස්තුමා (4) ශුද්ධ වූ ජෝන් ක්‍රිසොස්තම්තුමා
(5) ශුද්ධ වූ නසියන්ස්හි ග්‍රෙගරිතුමා

**34.** ක්‍රි.ව. 412 දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු ධූරයට පත් ව මිත්‍යා ඇදහිලිවලට ද වැරදි ප්‍රතිපත්තිවලට ද විරුද්ධව සටන් කළේ කවුරුන් ද?

(1) ශුද්ධ වූ සිරිල්තුමා (2) ශුද්ධ වූ අතනාසියස්තුමා
(3) ශුද්ධ වූ ටර්ටුලියන්තුමා (4) ශුද්ධ වූ අගොස්තීනුතුමා
(5) ශුද්ධ වූ ජෙරෝම්තුමා

**35.** "ප්‍රාණ පරිත්‍යාගීන්ගේ රුධිරය කිතුනුවන් බිහි වන බීජ වේ" යන වටිනා කියමන තම අත්දැකීම් ඇසුරෙන් ප්‍රකාශ කරන ලද්දේ,

(1) ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා විසිනි. (2) ශුද්ධ වූ ඔරිගන්තුමා විසිනි.
(3) ශුද්ධ වූ ජෙරෝම්තුමා විසිනි. (4) ශුද්ධ වූ සිරිල්තුමා විසිනි.
(5) ශුද්ධ වූ ටර්ටුලියන්තුමා විසිනි.

**36.** මරියතුමිය දේව මාතාව බවට තහවුරු කිරීම සඳහා හේතු වූ දුර්මතයක් ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) නෙස්ටෝරියන් (2) එව්ටිකස්
(3) ඒරියස් (4) නැපෝලියන්
(5) ප්ලේවියන්

Department of Examinations - Sri Lanka

Past Papers Wiki



37. පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - ස්ලැවික් ගෝත්‍රික ජනතාවට ශුද්ධ වූ බොනිපස්තුමා අක්ෂර මාලාවක් හඳුන්වා දුන්නේ ය.
B - සිස්ටර්සියන් තාපස නිකාය මොලෙස්මාහි රොබට් තාපසතුමන් විසින් ආරම්භ කරන ලදී.
C - ජර්මනියේ අපෝස්තුළුවරයා ලෙස ශුද්ධ වූ බොනිපස්තුමා හැඳින්විය.
D - බටහිර අධිරාජ්‍යයේ බිඳ වැටීම බටහිර කතෝලික සභාවේ නැග්මට හේතු විය.
E - කොන්ස්තන්තිනෝපලයේ ආදිපිතෘවරයා වූ කැමල්ඩොලේස් විසින් සභාවට චෝදනා ඉදිරිපත් කරන ලදී.
මේවායින් නිවැරදි ප්‍රකාශ වනුයේ,
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි. (4) C හා E පමණි. (5) D හා E පමණි.

38. දොළොස් වන සියවසේ ඇති වූ පළමු කුරුස යුද්ධයේ දී ශුද්ධ වූ සභාවට අත්පත් කර ගැනීමට හැකි වූයේ,
(1) රෝමය යි. (2) පැරිස් විශ්ව විද්‍යාලය යි.
(3) කොන්ස්තන්තිනෝපලය යි. (4) ජෙරුසලම යි.
(5) විටෙන්බර්ග් විශ්ව විද්‍යාලය යි.

39. දහතුන් වන සියවසේ ආරම්භ වූ ෆ්‍රැන්සිස්කාන නිකායෙන් බිහිවූ නිකායක් වූයේ,
(1) වින්සෙන්තියාන නිකාය යි. (2) දයාවේ සොහොයුරියන්ගේ නිකාය යි.
(3) කැපුචින් නිකාය යි. (4) කාර්මෙල් නිකාය යි.
(5) කුරුසියේ සොයුරියන්ගේ නිකාය යි.

40. ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට පිළිතුරු දීම සඳහාත්, කතෝලික සභාවේ ස්ථාවරත්වය ශක්තිමත් කර ගැනීම සඳහාත්, ක්‍රි.ව. 1545 දී
(1) තාපස හා පැවිදි නිකායන් ආරම්භ කරන ලදී.
(2) වෙස්ලි සොහොයුරන් දෙදෙනා විසින් ක්‍රියාකාරී සභාවක් ආරම්භ කරන ලදී.
(3) කැල්සිඩොන් මන්ත්‍රණ සභාව කැඳවන ලදී.
(4) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව කැඳවන ලදී.
(5) විශ්ව විද්‍යාල අසල කාර්මෙල් තාපසාරාම බිහි කරන ලදී.

41. අනාගත ලෝකයට සරිලන පරිදි ශුද්ධ වූ සභාවේ ද නවතාවක් හා යාවත්කාලීන වීමක් අවශ්‍ය බව අවධාරණයට ලක්කළේ කුමන ශුද්ධෝත්තම පියතුමන් විසින් ද?
(1) අති උතුම් XXIII වන ජුවාම්
(2) අති උතුම් II වන ජුවාම් පාවුලු
(3) අති උතුම් VI වන පාවුලු
(4) අති උතුම් XII වන ග්‍රෙගරි
(5) අති උතුම් XIII වන ලියෝ

42. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ තීරණ හා නියෝග ප්‍රථමයෙන් හා ප්‍රබලව බලපෑම් කළේ,
(1) ධර්මදූත සේවා කෙරෙහි ය. (2) ජනවන්දනාව කෙරෙහි ය.
(3) පැවිදි දිවිය කෙරෙහි ය. (4) පූජක දිවිය හා සේවා කෙරෙහි ය.
(5) දේව ප්‍රකාශ කෙරෙහි ය.

43. ජෝන් විලා ද කොන්දේ පියතුමාගේ නායකත්වය යටතේ ක්‍රි.ව. 1543 දී ශ්‍රී ලංකාවට පැමිණි ධර්මදූත කණ්ඩායම වන්නේ,
(1) ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරුන් ය. (2) ජේසු නිකායික ධර්මදූතවරුන් ය.
(3) දොමිනිකාන ධර්මදූතවරුන් ය. (4) අගොස්තීනු නිකායික ධර්මදූතවරුන් ය.
(5) නිර්මල මරිය නිකායික ධර්මදූතවරුන් ය.

44. කෝට්ටේ රජුගේ අවසරයෙන් කොළඹ වෙළඳ ගබඩාවක් ඉදිකර ඒ අසල කුඩා දෙව්මැදුරක් ඉදිකිරීමට කටයුතු කරන ලද්දේ,
(1) ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා විසිනි. (2) ජුවන් ද විලා විසිනි.
(3) අන්තෝනියෝ විසිනි. (4) ලොරෙන්සෝ ද අල්මේදා විසිනි.
(5) ගොන්සාලෝ විසිනි.

45. මෙරට පෘතුගීසි ධර්මදූත ප්‍රචාරයේ ඌනතාවක් ලෙස හැඳින්විය හැක්කේ කුමක්ද?
(1) දේශීය පූජකවරු පුහුණු නොකිරීම (2) ආගමික පොත් පත් නිකුත් නොකිරීම
(3) සේවය ජනතාවට ආකර්ශණය නොවීම (4) පෘතුගාලයෙන් අනුග්‍රහය නොලැබීම
(5) දේශපාලන බලයට නතු නොවීම



Department of Examinations - Sri Lanka

**46.** ඕලන්දය ස්පාඤ්ඤ ආධිපත්‍යයෙන් මිදී යුරෝපයේ ප්‍රබල රටක් වීමට හේතු වූයේ,
(1) ආගමික කටයුතු වලට මුල් තැනක් දීම ය.
(2) පෘතුගාලය සමඟ සම්බන්ධ වීම ය.
(3) පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම පිහිටුවා ගැනීම ය.
(4) විදේශීය පූජකවරුන්ගේ සහය ලැබීම ය.
(5) 'මැග්නා කාර්ටා' ගිවිසුම ක්‍රියාත්මක වීම ය.

**47.** 'ලක්දිව කතෝලික සාහිත්‍යයේ පියා' ලෙස සැලකෙන්නේ,
(1) ගරු පේද්‍රෝ ෆෙරාරෝ පියතුමා ය.
(2) ගරු ජෝශප් කර්වල්හෝ පියතුමා ය.
(3) ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ය.
(4) ගරු පේද්‍රෝ ද සල්දානා පියතුමා ය.
(5) ගරු ජෝශප් ද ජේසු මරිය පියතුමා ය.

**48.** ක්‍රි.ව. 1658 දී ලන්දේසි හමුදාව භාරව කටයුතු කිරීමට ලංකාවට පැමිණ ගාල්ලේ ලන්දේසි සේනාංකයේ පූජක සේවාව භාරව ද කටයුතු කළේ,
(1) ගරු ක්‍රිස්ටෝෆර් බොන්ජන් පියතුමා ය.
(2) ගරු ජෝශප් මේරි බ්‍රාවි පියතුමා ය.
(3) ගරු ජෝන් ස්ටීවන් සෙමේරියා පියතුමා ය.
(4) ගරු පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමා ය.
(5) ගරු ජෝන් ස්ටීවන් දේවගැතිතුමා ය.

**49.** දේව සමානකමේ හා මනුෂ්‍යත්වයේ උදාරත්වයේ ලක්ෂණ වන්නේ,
(1) කීකරුකම හා බැහැපත්කම යි.
(2) බුද්ධිය හා ප්‍රඥාව යි.
(3) දයාව හා කරුණාව යි.
(4) පරිත්‍යාගය හා නිහතමානීකම යි.
(5) දේව ගරුබිය හා දැනමුතුකම යි.

**50.** ශුද්ධ වූ පාවුලුතුමා 1 කොරින්ති 1:10-13 කොටසින් අවධාරණය කරන්නේ කුමක් ගැන ද?
(1) ධර්මදූත සේවයේ අවශ්‍යතාව
(2) බැහැපත්කම හා කීකරුකම
(3) ශුද්ධ වූ සභාවේ ඒකත්වයේ අවශ්‍යතාව
(4) එඬේරික සේවයේ වටිනාකම
(5) යාච්ඤා කිරීම

* * *

Department of Examinations - Sri Lanka
PAST PAPERS WIKI

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ධර්මය | II | 43 S II |
| கிறிஸ்தவம் | II | |
| Christianity | II | |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)

(ii) ශුද්ධ බයිබලයේ පසුබිම ගැන ගැඹුරු විමර්ශනයක යෙදුන ලූතරන් නිකායට අයත් ජර්මන් ජාතික විශාරදයන් විසින් පංච පුස්තකයේ කර්තෘත්වය මෝසෙස්ට ආරූඪ කිරීම ප්‍රශ්න කරන ලදී. ඔවුන් ගෙනහැර පෑ තර්ක **දෙකක්** දක්වන්න. (ලකුණු 04යි)

(iii) උත්පත්ති පොතේ පළමු පරිච්ඡේද එකොළහ අධ්‍යයනය කිරීමේ දී සැලකිය යුතු කරුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) ද්විතීය නීති සම්ප්‍රදාය (Deuteronomical tradition) මගින් ඉදිරිපත් කෙරෙන තේමා සහ ධර්ම, කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**2.** (i) සමදර්ශක ශුභාරංචි ගැටලුව පිළිබඳව කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) සමදර්ශක ශුභාරංචි අතර දක්නට ඇති සමානකම් **දෙකක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 04යි)

(iii) සමදර්ශක ශුභාරංචි හා ජොහන් ශුභාරංචිය අතර දක්නට ඇති අසමානතා **තුනක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) ධර්මදූත ප්‍රචාරය සඳහා ශුද්ධ වූ පාවුලුතුමා විසින් සිදුකළ ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කර, ඒවා ඉදිරියට ගෙනයෑමට ඔබහට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**3.** (i) ශුද්ධ වූ පේදුරුතුමා ජෙරුසලම් මන්ත්‍රණ සභාව තුළ දී ප්‍රබල ලෙස කථා කරමින් පැහැදිලි කළේ කුමක් ද? (ලකුණු 02යි)

(ii) අපොලොජිස්ත ලේඛකයෝ හෙවත් තර්කවේදීන් හඳුන්වා ඔවුන්ගේ කෘතිවල පොදු අරමුණු **දෙක** ලියන්න. (ලකුණු 04යි)

(iii) වැලේරියන් අධිරාජ්‍ය සමය තුළ (ක්‍රි.ව. 254 - 260 දක්වා) කිතුනුවන් මුහුණ පෑ පීඩන **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) වර්තමාන සමාජය තුළ ක්‍රියාවට නැංවිය හැකි මුල් සභාවේ තිබූ ලක්ෂණ **හතරක්** සඳහන් කර එම ලක්ෂණ නූතනයේ ක්‍රියාත්මක කිරීමට යාමේ දී මුහුණ දිය හැකි අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

## II කොටස

**4.** (i) ශුද්ධ බයිබලයේ සඳහන් පරිදි මැවීම පිළිබඳ පළමු කතාවේ පළමු දින පහ තුළ මවන ලද දෑ අනුපිළිවෙළින් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ඉහත 4(i) කතාවේ සඳහන් මිනිසා මත පැවරුණු වගකීම සඳහන් කර, එය ඔබ ජීවිතයේ දී සපුරාලන අයුරු කරුණු **හතරක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

**5.** (i) ශුද්ධ බයිබලයේ ගීතාවලියේ සියලුම ගීත, කරුණු හතක් යටතේ වර්ගීකරණය කළ හැක. ඉන් **පහක්** සඳහන් කර ඒවා විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ගීතාවලියේ 23 ගීතය සාරාංශ කර, එය පදනම් කොටගෙන ක්‍රිස්තුන් වහන්සේ හා ඔබ අතර ඇති සම්බන්ධය කරුණු **පහක්** කෙරෙහි අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**6.** (i) ශුද්ධ වූ මතෙව්තුමා ගෙනහැර දක්වන සභාවේ සාංඝිකත්වය හා එහි අධිකාරිය පිළිබඳ දේශනයෙහි අඩංගු කරුණු **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) කිසියම් ජන කණ්ඩායමක නායකත්වය සඳහා ඔබ තුළ තිබිය යුතු ගුණාංග **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**7.** (i) සයවන සියවස තුළ කිතුනු සභාවේ ලක්ෂණ **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)


(ii) ජාතික සමගිය හා ආගමික සහජීවනය ගොඩනැගීමට ඔබ දායක වන ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**8.** (i) නිදහසින් පසු යුගයේ දී ශ්‍රී ලංකාවේ උන්නතිය සඳහා කිතුනු සභාව සිදුකළ සේවා කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10යි)


(ii) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ ජීවිතාදර්ශය පෙරදැරි කර ගනිමින් තරුණ තරුණියන් වශයෙන් සමාජය තුළ ඔබ ක්‍රියාකරන ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

* * *

Department of Examinations - Sri Lanka



Store
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
ORDER BOOKS FROM LOL BOOKS STORE


ORDER GCE A/L
SHORT NOTES, MODEL,
REVISION BOOKS & PAST
PAPERS IN SINHALA, ENGLISH
& TAMIL MEDIUM
LOL
BOOK
STORE
CASH ON DELIVERY
AND KOKO PAYMENT
AVAILABLE
WHATSAPP - 0717774440
WEBSITE: WWW.LOL.LK
GET READY FOR YOUR A/Ls